**ශීර්ෂය - 333 - කොම්ප්ට්රොලර් ජනරාල් කාර්යාලය**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**------**

කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10:1 ඡේදයට අනුගතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 06 | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් වැයකිරීම් යටතේ පුද්ගල පඩිනඩි වියදම් රු.29,708,387 ක් ද වෙනත් වැය ශීර්ෂයන් වෙනුවෙන් දරන ලද වියදම් රු.167,344 ක් ද වශයෙන් දැක්විය යුතු වුවත් ඒ අනුව කටයුතු නොකර පුද්ගල පඩිනඩි වියදම් ලෙස රු .29,875,732 ක් දක්වා තිබුණි. | මෙම වෙනස වන්නේ මෙම කාර්යාලයේ නිලධාරීන්ගේ මැතිවරණ දීමනා වශයෙන් ගෙවූ රු .167,344 ක් බවත් , මෙම කාර්යාලයට අදාල අක්මුදලින් ගෙවීම් කර ඇති අතර රු .167,344 ක මුදල් ගලායැමක් සිදුව ඇති බැවින් එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇති බවත් දන්වා එවා තිබුණි. | අදාළ මාර්ගෝපදේශය අනුව ගෙවීම් වෙන් වෙන්ව දැක්විය යුතුවීම. |

**2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

**-----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ------------ |
| (අ) | වර්ෂය තුල අත්තිකාරම් අයකරගැනීම් රු.2,164,817 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.1,311,927 ක් ලෙස දක්වා තිබුණු නිසා මුදල් ගලාඒම් රු.852,890 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුල අත්තිකාරම් අයකර ගැනීම් වටිනාකම රු.2,164,817 ක් බවත්, එම වටිනාකමින් රු. 1,311,927 ක් මුදලින් අයකර ගෙන ඇති බවත් රු. 852,890 ක් හරස් සටහන් මගින් අයකර ගෙන ඇති බැවින් එහි මුදල් ගලා ඒමක් සිදුව නැති බැවින් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොමැති බවත් දන්වා එවා තිබුණි. | මාර්ගෝපදේශය අනුව දල වටිනාකම් අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතු වීම. |
| (ආ) | වර්ෂය තුල අත්තිකාරම් ගෙවීම් රු.1,957,777 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.1,499,501 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් මුදල් ගලායාම් රු.458,276 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුල අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 1,957,777 ක් බවත් එම වටිනාකමින් රු. 1,499,501 ක් මුදලින් ගෙවීම් කර ඇති බවත් මෙම කාර්යාලයේ නිලධාරීන්ට අත්තිකාරම් ණය වශයෙන් රු. 458,276 ක් හරස් සටහන් මගින් අත්තිකාරම් ගිණුමට හර කර ඇති බවත් එහි මුදල් ගලායාමක් සිදුව නැති බැවින් එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොමැති බවත් දන්වා එවා තිබුණි. | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයට අයත් සියලුම මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා මධ්‍යගත දත්ත පද්ධතියක් ඇති කිරීමට නව මෘදුකාංගයක් ආරම්භ කිරීමේ නිමැවුම සියයට 50 – 74 අතර ප්‍රමාණයක් විය. | අදාළ මෘදුකාංගය සකස් කිරීම ITMIS ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලැබිය යුතු අතර කටයුතු ඉතා ඉක්මනින් සිදු කරන ලෙස ඉල්ලීම් ගණනාවක් සිදු කර සාකච්ඡා කිහිපයක් පවත්වා ඇති බවත් එම කටයුතු කඩිනම් කිරීම මෙම කාර්යාලයේ පාලනයෙන් බැහැර බව | ක්‍රියාකාරී සැලැස්මේ අපේක්ෂිත ඉලක්ක උපරිමව ළඟාකරගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දින වනවිට සමස්ත අනුමත සේවක සංඛ්‍යාවෙන් 07 ක් හෙවත් සියයට 19 ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩුවලින් 03 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 අතරින් එක් සහකාර අධ්‍යක්ෂ තනතුරක් සඳහා වැඩබැලීමේ පදනමින් රාජකාරි කටයුතු ඉටු කරන අතර ද්විතියික හා තෘතියික මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා කාර්යාලය ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවී ඇති බවත් කළමනාකරණය කර ගත හැකි බවට හඳුනාගත් හා මීට පෙර විගණන විමසුම්වලදීද පෙන්වා දුන් පරිදි ප්‍රාථමික මට්ටමේ පැවති තනතුරු පුරප්පාඩු 03ක් යටපත් කිරීමට කටයුතු කර ඇති බව | මේ අයුරින් කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට අහිතකර අයුරින් බලපාන්නේ නම් එම පුරප්පාඩු පිරවීමට හෝ එසේ නොමැති නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය |